# පැණි වළලු



සිතුම්යා දහම්ලි මෙලීසා නුරාගොඩ

# පැණි වළලු

සිතුම්යා දහම්ලි මෙලීසා නුරාගොඩ
කතෘ

පළමු වෙලුම
මගේ දඟ මල්ල

දෙවන වෙලුම
පැණිවළලු

ශ්‍රේණිය
5 ශ්‍රේණිය

පාසල
මහා/මහාමායා බාලිකා විදුහල

කෘතිය පළ කරන දිනය
2026-05-10

ISBN No : 978-624-211-027-1

# පිදුම

ආදරණීය ගුරුතුමියට

ආදරණීය අම්මාට, තාත්තාට

හා ආදරණීය යාළුවෝ

හැමෝටම



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය


වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

එකමත් එක ලස්සන ගම්මානයක පුංචි පවුලක් ජීවත් වුණා. ඒ පවුලේ අම්මත්, තාත්තාත් , පුංචි දුවක් සිටියා. ඒ දුවගේ නම තමයි "මලී"

මලී හුරුබුහුටි ලස්සන ගැහැණු ළමයෙක්.



මලීගේ තාත්තා කරේ ගොවිතැන්. මලීගේ අම්මා කරේ පැණි වළලු සාදා විකුණන එකයි.

මලීගේ අම්මා හිමිදිරි උදෑසනම අවදි වී පැණි වළලු සාදන එක දිනපතා කරන කාර්යයක් විය.



උදෑසනම නැගිට වෙනදා මෙන්ම පැණි වළලු සෑදීමට අම්මා පටන් ගත්තා. මලී ද අවදි වී කුස්සියට පැමිණ අම්මාට උදවු කිරීමට සැරසුනා.


"දුවේ ඔයා මහන්සි නොවී ඉන්න." යැයි අම්මා පැවසුවා.



නෑ අම්මා මට පුළුවන් ඔයාට උදවු වෙන්න. මලීත් අම්මාත් මහන්සි වී පැණි වළලු ටික සාදා ගත්තා. මලීට පාසල් දවසක් නොවූ නිසා මලීත් අම්මා සමඟ පැණි වළලු විකිණීමට නිවසින් පිටත් වුණා.



අම්මාත් මලීත් නගරය දෙසට ළඟාවෙමින් සිටියා. ඒ යන අතරමඟ සිඟන්නෙක් පැමිණ කෑමට යමක් දෙන්නැයි ඉල්ලා සිටියා. අම්මා අදිමදි කරත් පැණි වළලක් දීමට මලීට සිතුනා.



අම්මා අපි එක පැණි වළල්ලක් දෙමු යැයි පවසා පැණි වළලු කූඩෙන් එකක් රැගෙන සිඟන්නට දුන්නා. සිඟන්නා පැණි වළල්ල රසකර කන හැටි මලී බලා සිටියා.
ඉන්පසුව පැණි වළලු වෙළඳාම් කර මලීත් අම්මාත් නිවසට පැමිණියා.



හැමදාමත් වගේ මලීත් අම්මාත් එනතුරු බලා සිටි සිඟන්නා පැණි වළලු ඉල්ලීම පුරුද්දක් කරගත්තා. මලීත් පැණි වළල්ලක් හැමදාම සිඟන්නාට දුන්නා.



“මේ පැණි වළලු නම් හරිම රසයි. මට ගොඩක් කන්න ආසයි. ඒත් මට දෙන්නේ එකයි. මම කොහොමහරි පැණි වළලු කූඩේම අරන් කන්න ඕනේ.” සිඟන්නා සිතන්නට වුණා.



පසුවදා අම්මාත් මලීත් එනතුරු සිඟන්නා බලා සිටියා. මලී ඈත සිටම සිඟන්නා දැක්කා. මලීත් අම්මාත් සිඟන්නාව පසුකරගෙන ගියා.

"අද මොකද මේ සිඟන්නා අපෙන් පැණි වළලු ඉල්ලුවේ නැත්තේ."

මලී කල්පනා කරමින් ඉදිරියට ගියා.



එකපාරට පිටුපසින් දුවගෙන ආ සිඟන්නා අම්මාගේ ඉනේ තිබුණු පැණි වළලු කූඩය රැගෙන දුවන්නට වුණා.

මලීත් අම්මාත් කලබල වුණු පාර හයියෙන් කෑ ගහගෙන සිඟන්නා පසු පස දිව ගියා.

"අයියෝ මගේ පැණි වළලු" යනුවෙන් අම්මා කෑ ගැසුවා.



සිඟන්නාට වැඩි දුරක් දුවගෙන යන්නට නොහැකි වුණා. පැණි වළලු කූඩය සමඟ පය පැටලී සිඟන්නා බිම වැටුණා. පැණි වළලු ටික එහේ මෙහේ විසිරි ගියා. මලී ඉක්මණින් එතනට දිව ගියා.



මලී දුටු විගස බය වී සිඟන්නා මලීගෙන් සමාව ගත්තා. එසේ කිරීමට හේතුව ද සිගන්නා මලීට පැවසුවා.

"වැඩි පුර ඉල්ලුමානම් මම දෙනවානේ" මලී පැවසුවා.



“කමක් නෑ අපි යමු” කියා පවසා මලී සිඟන්නාව නැගිටවා. එන්නකෝ අපි යමුයි කියලා අම්මත් සමඟ මලී සිඟන්නාව ගෙදර එක්කන් ආවා. සිඟන්නාට හොඳටම බඩගිනි ඇති ඒ වගේම පැණි වළලුත් ගොඩක් කන්න අසාව ඇති මලී ගෙදර එන ගමන් සිතමින් ආවා.



සිඟන්නට ඉඳගන්න කියා මලී අම්මාගෙන් බත් පිඟානක් බෙදාගෙන සිඟන්නට ගෙනවිත් දුන්නා. වතුර වීදුරුවකුත් ළඟින් තිබ්බා.

සිඟන්නා බත් ඔක්කෝම ඉක්මණින් කෑවා. මලී කුස්සියට දිව ගොස් ගෙදර කන්න තියලා තිබුණු පැණි වළලු පිඟාන සිඟන්නට ගෙනවිත් දුන්නා. සිඟන්නාගේ මූණට සතුටු සිනාවක් ආවා සිඟන්නා රස කරමින් පැණි වළලු කෑවා.





මලී මේ කරන දේවල් දිහා අම්මා සතුටින් බලා සිටියා. "මගේ පැණි වළලු කූඩය නිසා මගේ දුවගේ හොඳ ගති ගුණ මට දකින්න පුළුවන් වුණා" යැයි පවසා අම්මා මලීගේ ඔළුව අතගෑවා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN No : 978-624-211-027-1